# ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ශික්ෂණලාභීන් මුහුණ දෙන විනය ආශ්‍රිත ගැටලු හා ඒ සඳහා වූ උපදේශාත්මක මැදිහත්වීම් පිළිබඳ අධ්‍යයනයක්

University of Colombo
Sri Lanka
09 JUN 2015
Examination Branch
Colombo - 03

ජී. එච්. ජී. එන්. අයි. රුක්ලන්ති

ශාස්ත්‍රවේදී (කොළඹ - 1991), පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (කොළඹ - 1995),
ශාස්ත්‍රපති (කැළණිය - 1998), අධ්‍යාපනපති (කොළඹ - 2000)

University of Colombo
Library
Sri Lanka

UCLIB
586108

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා
කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයට
ඉදිරිපත් කෙරෙන නිබන්ධනය
2008

# සංක්ෂිප්තය

"විනය ආශ්‍රිත ගැටලු", ශ්‍රී ලාංකික සමාජයට පමණක් නො ව, ලෝක ප්‍රජාවට ද එක සේ අදාළ වන තත්වයකි. සාමාන්‍ය සමාජය තුළ ද යම් විනය පිරිහීමක් ඇති බවට විවිධ අදහස් මතු වෙන අවධියක, පාසල් හා උසස් අධ්‍යාපන ආයතන ද එම තත්වයෙන් මිදී ඇතැයි සිතිය නො හැකි ය. එසේම, මෑත භාගයේ දෙස් - විදෙස් පාසල් හා උසස් අධ්‍යාපන ආයතනවල විනය ආශ්‍රිත ගැටලු ඇති වූ අවස්ථා පිළිබඳ ව ජන මාධ්‍යයන්ගෙන් ලැබෙන තොරතුරුවල ද ඉහළ යාමක් දක්නට හැකි ය. ඒ නිසා ම විනය ආශ්‍රිත ගැටලු පිළිබඳ ව පර්යේෂණ මට්ටමෙන් අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවයක් වේ.

අනාගත ලෝකය සකසන ආයතන වූ පාසල්වල, සිසු දරුවන්ට නිසි මග පෙනවීමේ වගකීම දරන ගුරුවරුන්, අධ්‍යාපන පද්ධතියට ලබා දෙන ආයතන වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පැවැත්ම ම විනය මූලික කර ගත්තකි. ඒ, විනයෙන් තොර අධ්‍යාපනයක් නො වන බැවිනි. මේ නිසා ම, සුවිශේෂයෙන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල විනය ආශ්‍රිත ගැටලු පවතී දැ යි විමසීමට මෙම පර්යේෂණය යොමු වෙයි.

වර්තමානයේ සීඝ්‍ර ලෙස ජනප්‍රිය බවට පත් වන විෂයක් වන උපදේශනය හා මාර්ගෝපදේශය, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පාඨමාලාවේ හර විෂයයක් ද වේ. එය කොතෙක් දුරට විද්‍යාපීඨවල පැවැත්මට ප්‍රායෝගික ව දායක වේ ද යන්න හා විනය ආශ්‍රිත ගැටලු ඇති නො වීමටත්, ඇති වූ ගැටලු විසඳා ගැනීමටත්, ඉන් ලැබෙන දායකත්වය විමසීම, සමස්ත විද්‍යාපීඨවල පැවැත්මට මෙන්ම, උපදේශන හා මාර්ගෝපදේශ විෂයයේ සංවර්ධනයට ද හේතු වනු නො අනුමාන ය. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ශික්ෂණලාභීන් මුහුණ දෙන විනය ආශ්‍රිත ගැටලු මොනවාද යන්න අධ්‍යයනය කරන අතර ම, එම ගැටලු විසඳා ගැනීමට හා අවම කර ගැනීමට හෝ ඇති නො වීමට, උපදේශන හා මාර්ගෝපදේශය විෂයයෙන් ලැබෙන පිටිවහල විමසීම, මෙම පර්යේෂණයේ අරමුණු වෙයි.

මේ සම්බන්ධ ව අධ්‍යයනය කිරීමේ දී මාතෘකාවට අදාළ දෙස් - විදෙස් පර්යේෂණ හා පර්යේෂණ නො වන මට්ටමේ තොරතුරු ද රැස් කර ගන්නා ලදී. එම තොරතුරු පර්යේෂණ වාර්තාවේ දෙවන පරිච්ඡේදයේ ඇතුළත් වේ. එහි, මීට පෙර පාසල් හා උසස් අධ්‍යාපන ආයතනවල සිදු වන විනය ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් දේශීය වශයෙන් හා විදේශීය වශයෙන් කරනු ලැබූ පර්යේෂණ අධ්‍යයන

කිහිපයක තොරතුරු ආශ්‍රයෙන්, කවර වූ හෝ අධ්‍යාපන ආයතනයකට පොදු වූ විනය ආශ්‍රිත ගැටලු ලැයිස්තුගත කර ඇති අතර, එම ගැටලු සමථයකට පත් කිරීම සඳහා උපදේශනයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග ද සාකච්ඡා කර තිබේ.

පර්යේෂණය ක්‍රියාත්මක කිරීම් දී ශ්‍රී ලංකාවේ දැනට පවතින ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 17 න් තෝරා ගත් විද්‍යාපීඨ පහක ශික්ෂණලාභීන් හා කථිකාචාර්යවරුන් නියැදි කණ්ඩායමක් ලෙස පර්යේෂණයට සම්බනධ කර ගන්නා ලදී. ඊට අමතර ව, සම්මුඛ සාකච්ඡා, සහභාගී නිරීක්ෂණ හා සිද්ධි අධ්‍යයන ඇසුරින් ද තොරතුරු අනාවරණය කර ගන්නා ලදී. පර්යේෂණය ඇසුරින් ලබා ගත් එම සියලු තොරතුරු 3 වන පරිච්ඡේදයට ඇතුළත් ය.

අනාවරණය කර ගත් තොරතුරු විශ්ලේෂණය කිරීම 4 වන පරිච්ඡේදය තුළින් සිදු විය. විශ්ලේෂණය පහසු කිරීම සඳහා ප්‍රස්තාර භාවිත කෙරිණ. ජව සම්පන්න තරුණ කණ්ඩායම් නේවාසික ව රැඳෙමින් අධ්‍යයන කටයුතු ක්‍රියාත්මක කෙරෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල නිරන්තරයෙන් පවතින විනය ගැටලු රැසක් මේ තුළින් අනාවරණය කර ගැනීමට හැකි විය. අභ්‍යන්තර හා බාහිර විභාගවලදී ත්, පැවරුම් ඉදිරිපත් කිරීමේදී ත්, කොපි කිරීම් සිදු වන බව ඉන් එක් අනාවරණයකි.

5 වන පරිච්ඡේදයෙන් නිගමන හා යෝජනා ඉදිරිපත් කරන ලදී. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ව්‍යුහය හා සංවිධානය සම්බන්ධයෙන් සංවර්ධන යෝජනා සහ උපදේශනය හා මාර්ගෝපදේශය විෂය විද්‍යාපීඨ තුළ වඩාත් ප්‍රායෝගික කර වීම උදෙසා වූ යෝජනා, එම පරිච්ඡේදයේ ඇතුළත් වේ. ශික්ෂණලාභීන්ට දැඩි සේ මානසික පීඩාවන් ඇති කරනු ලබන නීති රෙගුලාසි බොහොමයක් කාලානුරූප ව සංස්කරණය විය යුතු අතර, අධ්‍යයන කාර්ය මණ්ඩල හා ශික්ෂණලාභීන් වඩාත් සමීප ව හා අන්‍යෝන්‍ය අවබෝධයෙන් ක්‍රියා කිරීම ද අත්‍යාවශ්‍ය බව එහි අවධාරණය කර තිබේ. සක්‍රීය ලෙස ක්‍රියාත්මක කෙරෙන උපදේශන මධ්‍යස්ථාන, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල අනිවාර්ය අංගයක් විය යුතු බව ද එහි සඳහන් සුවිශේෂී යෝජනාවක් වෙයි.

University of Colombo Library Sri Lanka

# Abstract

Discipliinary problems are not limited to Sri Lankan society only, but to all other countries. At a time, when there is a downward trend in discipline even in the general society, schools and higher education institutes are the same. Also via media we hear there is an increase in disciplinary problems in educational institutes, world over, Therefore it is necessary to research these aspects.

The disciplinary problems in National Colleges of Education should be very important because these colleges produce the teachers for educating the future children.Therefore this research is mainly about discipline issues in National Colleges of Education.

At present Guidance and Counseling is a subject in syllabus of NCoE, it is important to check whether it helps to solve the disciplinary problems in NCoEs.What are the problems these students face and any impovements to this subject to reduce these problems in NCoEs.

In this study, research reports and other related news reports in Sri Lanka and other countries are reviewed. These data are included in the second chapter of this research report. In this chapter discussion about disciplinary problems common to any educational institute and how counseling can help to resolve issues are reviewed.

To do this study, took the consultation of sample groups of lecturers and students from five NOoEs out of 17 NCoEs in Sri Lanka were selected.

Questionnaire was the main method to gater information. Also gathered information from interviews and observations. Methods are dicussed in the third Chapter.

Data are analyzed in the fourh chapter. Pie charts are included to improve the analysis. As young students are staying and studying in these colleges, this research could disclose lot of existing disciplinary problems. One problem is, copying answers during internal and external examination and also when submitting assignments. Raging too is a problem in NCoES. There are lot of instances of students action against the Administration and going out of the premises without permission.

Results and proposals are indicated in fifth chapter. Proposals to improve the subject Guidance and Counceling with practical component in the NCoE given. Proposals to make changes in some roles and regulations which give lot of pressure to students are presented. Also a proposal to have an active Counseling Center in every NCoE is made.